රහස්‍යයි

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## இலங்கைப் பரீட்சைத் திணைக்களம்
## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2025 (2026)
## க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2025 (2026)

විෂය අංකය / பாட இலக்கம்: **11**

විෂයය / பாடம்: **බුද්ධ ධර්මය**

### I පත්‍රය - පිළිතුරු
### I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 2 | 21. | 3 | 31. | 3 |
| 02. | 3 | 12. | 4 | 22. | 4 | 32. | 1 |
| 03. | 3 | 13. | 4 | 23. | 3 | 33. | 4 |
| 04. | 3 | 14. | 1 | 24. | 1 | 34. | 3 |
| 05. | 4 | 15. | 1 | 25. | 4 | 35. | 4 |
| 06. | 2 | 16. | 4 | 26. | 4 | 36. | 2 |
| 07. | 2 | 17. | 2 | 27. | 1 | 37. | 3 |
| 08. | 4 | 18. | 2 | 28. | 4 | 38. | 4 |
| 09. | 3 | 19. | 1 | 29. | 3 | 39. | 2 |
| 10. | 4 | 20. | 3 | 30. | 4 | 40. | 3 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

**මුළු ලකුණු** / மொத்தப் புள்ளிகள் 01 × 40 = 40

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

**නිවැරදි පිළිතුරු සංඛ්‍යාව** / சரியான விடைகளின் தொகை: $\frac{25}{40}$

**I පත්‍රයේ මුළු ලකුණු** / பத்திரம் I இன் மொத்தப்புள்ளி: $\frac{25}{40}$

Past Papers Wiki



# අ.පො.ස. (සා. පෙළ) විභාගය 2025(2026)

## 11 - බුද්ධ ධර්මය

## II - පත්‍රය පිළිතුරු

1. (i) බෝසතුන්ගේ අනුපමේය රූපශ්‍රිය දැක "මෙවන් පුතකු ලද මවක් පියෙක් නිවුණෝ වෙති" යනුවෙන් ප්‍රකාශ කරනු ලැබුවේ කවුරුන් විසින් ද?
(ii) රහසත් පව් නො කොට - කෙලෙසරයනුත් දුරුකොට ...
යනාදී පද්‍යයෙන් කියවෙන්නේ කිනම් බුදුගුණය ද?
(iii) ධර්ම රත්නයෙහි ගුණයක් වන 'ස්වාක්ඛාත' යන්නෙහි අර්ථය ලියන්න.
(iv) බොරැල්ල ගෝතමී විහාරයේ බිතු සිතුවම් අඳිනු ලැබූ ශිල්පියාගේ නම කුමක් ද?
(v) 'නිබ්බානං පරමං සුඛං' යන්නෙහි අදහස ලියන්න.
(vi) 'අනවජ්ජ සුඛය' පහදන්න.
(vii) "සමණාමයං මහාරාජ - ධම්මරාජස්ස සාවකා" යන්න කවුරුන් විසින් කා හට ප්‍රකාශ කරන ලද්දක් ද?
(viii) මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන හා පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන ආරම්භ කළ නාහිමිවරුන්ගේ නම් ලියන්න.
(ix) දුමින්දාගමනයෙන් ශ්‍රී ලාංකිකයින් ලැබූ දායාද දෙකක් සඳහන් කරන්න.
(x) තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් රචනා කරනු ලැබූ ග්‍රන්ථ දෙකක නම් ලියන්න.

(i) කිසා ගෝතමී (ලකුණු 02)

(ii) අරහං බුදු ගුණය/ අරහං ගුණය/ අරහං (ලකුණු 02)

(iii) මනාව දේශනා කරන ලද/ මොනවට දෙසන ලද/ මනා කොට දෙසූ/ මුල, මැද, අග තුන් තැන්හි යහපත් වූ (ලකුණු 02)

(iv) ජෝර්ජ් කීට් (ලකුණු 02)

(v) නිවන පරම සැපයයි./ නිර්වාණය පරම සැපතයි./ පරම සුඛය නිවනයි. (ලකුණු 02)

(vi) නිවැරදි කාය, වාක්, මනෝ කර්මයන්ගෙන් යුතුව ක්‍රියා කිරීම නිසා ඇතිවන සැපය. නිවැරදිව දිවි ගෙවමියි ඇතිවන සැපය (ලකුණු 02)

(vii) මිහිඳු මහරහතන් වහන්සේ විසින් දේවානම්පියතිස්ස රජතුමාට/ මිහිඳු හිමි විසින් දෙවනපෑතිස් රජුට/ මිහිඳු හිමි විසින් තිස්ස රජුට (ලකුණු 02)

(viii) හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි, රත්මලානේ ශ්‍රී ධර්මාලෝක නාහිමි/
හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, රත්මලානේ ශ්‍රී ධර්මාලෝක හිමි
සුමංගල හිමි / ධර්මාලෝක හිමි   හික්කඩුවේ හිමි / රත්මලානේ හිමි
පිළිතුරු දෙකම ලියා ඇති විට අනුපිළිවෙලින් තිබිය යුතු ය. (ලකුණු 02)

(ix) ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව ලැබීම
ප්‍රතිමා කලාව බිහිවීම
වාස්තු විද්‍යාත්මක නිර්මාණ බිහිවීම
චිත්‍ර කලාව ඇතිවීම
මූර්ති කලාව ඇතිවීම
කැටයම් කලාව ඇතිවීම
ගෘහ නිර්මාණ ශිල්පය දියුණුවීම
බෝධි සාහිත්‍යයක් බිහිවීම
බෝධි සංස්කෘතියක් බිහිවීම
ආදී අදාළ ඕනෑම කරුණු දෙකකට ලකුණු දෙක ලබා දෙන්න. (ලකුණු 02)



CamScanner

(x). 1. සැළලිහිණි සන්දේශය/ සැළලිහිණිය
2. පරෙවි සන්දේශය/ පරෙවිය
3. කාව්‍යශේඛරය / කව්සේකර
4. පඤ්චිකා ප්‍රදීපය
5. බුද්ධිප්පසාදිනී

මෙ අතුරින් ග්‍රන්ථ දෙකක නම් ලියා ඇත්නම් ලකුණු දෙක ලබා දෙන්න. **(ලකුණු 02)**

**2. (i) දස පාරමිතා අතුරෙන් දෙකක් නම් කරන්න.**

දස පාරමිතා ධර්ම

1. දාන පාරමිතාව (දාන පාරමිතා)
2. ශීල පාරමිතාව (සීල පාරමිතා)
3. නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව (නෙක්ඛම්ම පාරමිතා)
4. ප්‍රඥා පාරමිතාව (පඤ්ඤා පාරමිතා)
5. වීර්ය පාරමිතාව (විරිය පාරමිතා)
6. ක්ෂාන්ති පාරමිතාව (ඛන්ති පාරමිතා)
7. සත්‍ය පාරමිතාව (සච්ච පාරමිතා)
8. අධිෂ්ඨාන පාරමිතාව (අධිට්ඨාන පාරමිතා)
9. මෛත්‍රී පාරමිතාව (මෙත්තා පාරමිතා)
10. උපේක්ෂා පාරමිතාව (උපෙක්ඛා පාරමිතා)

පාරමිතා ලකුණු නැත. දානං සීලං ඇති කොළ ලකුණු දෙන්න.

මෙ අතුරින් පාරමිතා දෙකක් නම් කර ඇත්නම් ලකුණු දෙක ලබා දෙන්න. **(ලකුණු 02)**

**(ii) ඉහත (i) හි නම් කළ එක් පාරමිතාවක් සැකෙවින් පැහැදිලි කරන්න.**

**1. දාන පාරමිතාව (දාන පාරමිතා)**

තමන් සතු දෙයක් අන් අයට පරිත්‍යාග කිරීමයි. එනම් තෘෂ්ණා මානාදියෙන් තොරව කරුණා ප්‍රඥාවෙන් යුතුව දෙන දානයයි.

PAST PAPERS WIKI

**2. ශීල පාරමිතාව (සීල පාරමිතා)**

සීලය යනු ප්‍රාණඝාතාදී අකුසල්වලින් වැළකී කය වචන සංවර කර ගැනීමයි. එනම් තෘෂ්ණා මානාදියෙන් තොරව කරුණා ප්‍රඥාවෙන් යුතුව සීලය සම්පූර්ණ කිරීමයි.

කෙටියෙන් ප්‍රමාණවත්

**3. නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව (නෙක්ඛම්ම පාරමිතා)**

පස්කම් සැප හැර දමා ගිහිගෙයින් නික්ම යාම නෙක්ඛම්ම නම් වේ. එනම් තෘෂ්ණා මානාදියෙන් තොරව කරුණා ප්‍රඥාවෙන් යුතුව නිවන් අපේක්ෂාවෙන් පස්කම් සැප හැර දැමීම යි.



CamScanner

**4. ප්‍රඥා පාරමිතාව (පඤ්ඤා පාරමිතා)**

ලෝකය හා සත්ත්වයා එනම් පඤ්චස්කන්ධය පිළිබඳ යථා තත්ත්වය දැකීම ප්‍රඥාවයි. එනම් තෘෂ්ණා මානාදියෙන් තොරව කරුණා ප්‍රඥාවෙන් යුතුව ක්‍රියා කිරීම යි.

**5. වීර්ය පාරමිතාව (විරිය පාරමිතා)**

තමන්ගේත් අනුන්ගේත් යහපත සඳහා නොපසුබට උත්සාහයෙන් කටයුතු කිරීම වීර්යය යි. එනම් තෘෂ්ණා මානාදියෙන් තොරව කරුණා ප්‍රඥාවෙන් යුතුව කරන බලවත් උත්සාහය යි.

**6. ක්ෂාන්ති පාරමිතාව (ඛන්ති පාරමිතා)**

දුෂ්කරතා, කායික-මානසික පීඩා ආදිය ඉවසීමයි. එනම් තෘෂ්ණා මානාදියෙන් තොරව කරුණා ප්‍රඥාවෙන් යුතුව ඉවසීම ප්‍රගුණ කිරීමයි.

**7. සත්‍ය පාරමිතාව (සච්ච පාරමිතා)**

කිසිවකු නොරවටා, මුලා නොකර සත්‍යගරුකව ක්‍රියා කිරීම යි. එනම් තෘෂ්ණා මානාදියෙන් තොරව කරුණා ප්‍රඥාවෙන් යුතුව මුසාවාදයෙන් වැළකී සත්‍යයෙහි පිහිටීමයි.

**8. අධිෂ්ඨාන පාරමිතාව (අධිට්ඨාන පාරමිතා)**

අභිමතාර්ථයක් ඉටු කර ගැනීම සඳහා උපදවා ගත් සිත වෙනස් නොකොට ඒ අයුරින්ම පවත්වා ගැනීමයි. එනම් තෘෂ්ණා මානාදියෙන් තොරව කරුණා ප්‍රඥාවෙන් යුතුව අධිෂ්ඨානශීලීවීමයි.

**9. මෛත්‍රී පාරමිතාව (මෙත්තා පාරමිතා)**

සියලු සතුන් කෙරෙහි මෙත් සිත් පැතිරවීමයි. සතුරු, මිතුරු, මැදහත් සියල්ලන්ට ම මෛත්‍රිය දැක්වීමයි. එනම් තෘෂ්ණා මානාදියෙන් තොරව කරුණා ප්‍රඥාවෙන් හා උපාය කෞශලයෙන් යුතුව සැමට මෛත්‍රිය දැක්වීම යි.

**10. උපේක්ෂා පාරමිතාව (උපෙක්ඛා පාරමිතා)**

හිතවත් අහිතවත් සියල්ලන් කෙරෙහි ඇලීම්, ගැටීම් දෙකෙන් තොරව සම ව පැවැත්මයි. එනම් තෘෂ්ණා මානාදියෙන් තොරව කරුණා ප්‍රඥාවෙන් යුතුව මැදහත්ව කටයුතු කිරීමයි.

එකක් කෙටියෙන් පැහැදිලි කර තිබේ නම් ලකුණු තුන ලබා දෙන්න. **(ලකුණු 03)**

**(iii) දස පාරමිතාවල උගන්වන ගුණධර්ම පූරණය කිරීමෙන් පරාර්ථ සේවය සැලසෙන ආකාරය පැහැදිලි කරන්න.**

- පාරමිතා ධර්ම පූරණය බුදු, පසේබුදු, මහරහත් බව උදෙසා ඉවහල් වන බැවින් බුද්ධකාරක ධර්ම ලෙස හැඳින්වේ.
- පාරමිතා ධර්ම සම්පූර්ණ කිරීමෙන් පුද්ගලයාගේ ස්වාර්ථය මෙන්ම පරාර්ථය ද සැළසේ.
- දානය පරමිතාවක් ලෙස සම්පූර්ණ කරන පුද්ගලයාට සාංසාරික අරමුණු සාක්ෂාත් කර ගැනීමට එය උපකාරී වන අතර ම ප්‍රත්‍ය ලබන පුද්ගලයාට ඒ තුළින් මහත් ලාබයක් ලැබේ.
- සීල පාරමිතාව පිරීමෙන් ප්‍රාණඝාතය, කාම මිත්‍යාචාරය ආදියෙන් වැළකීම හේතුවෙන් සමාජයේ සියලු දෙනාට බිය, තැති ගැනීමෙන් තොරව ජීවත් වීමේ හැකියාව ලැබේ.
- මෛත්‍රිය පාරමිතාවක් ලෙස වඩන්නා පුද්ගලයා නිසා කිසිවෙකුට පීඩාවක් ඇති නොවේ. අන් අයට පීඩා නොකරන පුද්ගලයන්ගෙන් සමාජයට ද කිසිදු හානියක් සිදු නොවේ.
- උපේක්ෂා පාරමිතාව ප්‍රගුණ කිරීම නිසා අටලෝ දහමින් අකම්පිතව මධ්‍යස්ථව කටයුතු කරයි. ඒ තුළින් සාධාරණ යුක්ති සහගත සමාජයක් ගොඩනගා ගත හැකිය.
- සත්‍ය කතා කිරීම නිසා කිසිවෙකු රැවටීමට ලක් නොවේ. එමඟින් බොරුව, වංචාව වැනි සමාජයට අහිතකර තත්ත්වයන් නැතිවීමෙන් පරාර්ථය සිදු වේ.

යනාදි වශයෙන් දසපාරමිතා තුළින් පරාර්ථය සිදුවන ආකාරය විග්‍රහකර තිබිය යුතු ය.

පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න. **(ලකුණු 05)**

පාරමිතා තුනක්වත් ඇතුලත් විය යුතුය.

**3. (i) "අත්තනාව කතං පාපං" යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර ලියන්න.**

අත්තනාව කතං පාපං
අත්තනා සංකිලිස්සති
අත්තනා අකතං පාපං
අත්තනාව විසුජ්ඣති
සුද්ධි අසුද්ධි පච්චත්තං
නාඤ්ඤමඤ්ඤෝ විසෝධයේ/ නාඤ්ඤෝ අඤ්ඤං විසෝධයේ

ගාථාව සම්පූර්ණයෙන් ලියා ඇත්නම් ලකුණු දෙක ප්‍රදානය කරන්න.

අක්ෂර වින්‍යාසය නො සලකන්න. **(ලකුණු 02)**

වැරදි 3ට වැඩිනම් ලකුණු දෙන්නා. (ප්‍රශ්න පත්‍රයේ ඇති පරිදි)

**(ii) එම ගාථාවේ තේරුම ලියන්න.**

- යමෙකු පව් කළොත් එයින් ඔහු ම කෙලෙසෙන්නේ ය. යමෙකු පව් නො කළොත් එයින් ඔහු ම පිරිසිදු වන්නේ ය. පිරිසිදුකම හා අපිරිසිදුකම පවතින්නේ තමා කෙරෙහිම ය. එක් අයෙකුට තවත් අයෙකු පිරිසිදු කළ නොහැකි ය.

හෝ

PAST PAPERS WIKI



CamScanner

- තමා විසින් කරන ලද පවෙන් තමා අපිරිසිදු බවට පත්වේ. තමා විසින් නොකරන ලද පවෙන් තමා පිරිසිදු බවට පත් වේ. පිරිසිදු අපිරිසිදු බව තමා විසින් ම දත යුතුය. කෙනෙකුට තවත් අයෙකු පිරිසිදු කළ නොහැකි ය.

හෝ

- තමා කළ පවෙන් තමා අපිරිසිදු බවටත් තමා නොකළ පවෙන් තමා පිරිසිදු බවටත් පත් වේ. පිරිසිදු අපිරිසිදු බව පවතින්නේ තමා වෙතම ය. කෙනෙකුට තවත් අයෙකු පිරිසිදු කළ නොහැකි ය.

ගාථාවේ සම්පූර්ණ අදහස තිබේ නම් ලකුණු තුන ලබා දෙන්න. **(ලකුණු 03)**

**(iii) තමා විසින් සිදු කරනු ලබන ක්‍රියා පුද්ගලයාගේ දියුණුවට හා පරිහානියට ඉවහල් වන ආකාරය පෙන්වා දෙන්න.**

- බුදු දහමට අනුව තමා සිදු කරනු ලබන ක්‍රියාවල වගකීම තමාට පැවරෙන අතර පුද්ගලයා විසින් කරනු ලබන හොඳ සහ නරක ක්‍රියාවල ප්‍රතිඵල තමා විසින්ම අත්විඳිය යුතු ය.
- පුද්ගලයෙකුගේ දියුණුව හෝ පරිහානිය රඳා පවතින්නේ එම පුද්ගලයා විසින් සිත, කය, වචනය මුල් කර ගෙන සිදු කරනු ලබන ක්‍රියාව අනුව ය.
- අලෝභ, අදෝෂ, අමෝහ චේතනා පදනම් කොට ගෙන ඇතිවන කරුණාව, මෛත්‍රිය සහ ඉවසීම වැනි ගුණාංග ප්‍රගුණ කිරීමෙන් තම සිත පිරිසිදු භාවයට පත්වන අතර ස්වකීය ක්‍රියාවන්ද කුසල පක්ෂයට බර වෙයි. කුසල ක්‍රියාවල විපාකය ද යහපත් වන අතර පිරිසිදු සිත මුල් ගනු ලබන නිවැරදි තීරණ නිසා ඒවා පුද්ගලයාගේ අභිවෘද්ධියට සෘජුවම බලපායි.
- ලෝභය, ද්වේෂය, මෝහය වැනි අකුසල චේතනා මුල්කරගත් සිතුවිලි ප්‍රගුණ කිරීමෙන් සිත අපිරිසිදුභාවයට පත්වේ. එම අපිරිසිදු සිතින් බොරුකීම, සොරකම් කිරීම, මත්ද්‍රව්‍ය පානය වැනි අයහපත් ක්‍රියා සිදුකිරීමෙන් පුද්ගලයා පිරිහීමට පත්වේ. එමගින් ආර්ථික හා සමාජීය වශයෙන් පිරිහෙන අතර අපකීර්තියට ද පත් වේ.

PAST PAPERS WIKI

පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න. **(ලකුණු 05)**

**4. (i) ස්තූප ගොඩනැංවීමේදී අදාළ කරගනු ලබන ආකෘති හයෙන් දෙකක් ලියා දක්වන්න.**

1. ඝණ්ඨාකාර (ගණ්ඨාරයක හැඩය)
2. ඝටාකාර (කළයක හැඩය)
3. බුබ්බුලාකාර (දිය බුබුලක හැඩය)
4. ධාන්‍යාකාර (ධාන්‍ය ගොඩක හැඩය)
5. පද්මාකාර (නෙළුම් මලක හැඩය)
6. ආමලකාකාර (නෙල්ලි ගෙඩියක හැඩය)

මින් ආකෘති දෙකක් නම් කර ඇත්නම් ලකුණු දෙක ලබා දෙන්න. **(ලකුණු 02)**



CS CamScanner

**(ii) ස්තූපාංග දෙකක් නම් කර එකක් පහදන්න.**

1. තුන් මහල් පේසාව
2. ගර්භය
3. හතරැස් කොටුව
4. දේවතා කොටුව
5. කොත් කැරැල්ල
6. කොත
7. චූඩා මාණික්‍යය

5+7 = 6
කොත්කැරැල්ල
චූඩා මාණික්‍යය } කොත.

- **තුන් මහල් පේසාව**

ස්තූපයේ පාදම මත පිහිටුවා ඇති කවාකාර වළලු තුනයි. "පුප්ඵාධාන" යන පාලි වචනයෙන් බිඳී ආ මල් පියවසා යන්න සඳහා මෙය භාවිත වේ යැයි සෙනරත් පරණවිතාන මහතා පවසයි. මුල් යුගයේ පළමු පේසා වළල්ල ප්‍රදක්ෂිණා කිරීම සඳහාත්, ඉතිරි පේසා වළලු මල් පූජා කිරීම සඳහාත් භාවිත කර ඇතැයි සැලකේ.
තුන් මහල් පේසා වළලු තුළින් ත්‍රිවිධරත්නය සංකේතවත් කරන බව පරණවිතාන මහතා සඳහන් කරයි.

- **ගර්භය**

ස්තූපයේ විශාලම කොටස මෙයයි. ගර්භයේ හැඩය අනුව ස්තූප ආකෘතිය ද තීරණය වේ. ගර්භය තුළ පේසා වළලු මට්ටමේ සිට ධාතු ගර්භය ගොඩ නගා ඇත. ධාතූන් වහන්සේලා ඇතුළු පූජා භාණ්ඩ තැන්පත් කොට ඇත්තේ එම ධාතු ගර්භය තුළයි.
ධාතු ගර්භයෙන් අසූහාරදහසක් ධර්මස්කන්ධය නිරූපණයවන බව සෙනරත් පරණවිතාන මහතා සඳහන් කරයි.

- **හතරැස් කොටුව**

ශ්‍රී ලංකාවේ ස්තූපවල උපරි භාගයේ සිදු වූ විකාසය අනුව ගර්භයට ඉහළින් ගොඩ නගා ඇති සමචතුරස්‍රාකාර කොටසයි. භාරතීය ස්තූපවල හර්මිකා නමින් හැඳින්වෙන මෙම අංගය ලාංකේය ස්තූපවල හතරැස් කොටුව නමින් හඳුන්වා ඇත. 'සිව් කොන් සැය' 'සිව් රැස් කොටුව' 'සිව් කොන් කොටුව' ආදී නම්වලින් ද පැරණි ග්‍රන්ථවල මෙය දැක්වේ.
සෙනරත් පරණවිතාන මහතා දක්වන පරිදි මේ තුළින් චතුරාර්ය සත්‍යය නිරූපණය කරයි.

- **දේවතා කොටුව**

හතරැස් කොටුවට ඉහළින් පිහිටුවා ඇති සිලින්ඩරාකාර කොටස දේවතා කොටුව නමින් හැඳින්වේ.
මේ තුළින් සතරවරම් දෙවිවරුන් හා දිව්‍යලෝක නිරූපණය වන බව සෙනරත් පරණවිතාන මහතා සඳහන් කරයි.



CamScanner

- **කොත් කැරැල්ල**

පැරණි ස්තූපවල හතරැස් කොටුව මත ශිලාමය යෂ්ටියක් පිහිටුවා ඒ මත ඡත්‍රයක් ලැවි කර තිබුණි. පසුව ඡත්‍ර කිහිපයක් හෙවත් ඡත්‍රාවලියක් දක්වා එය විකාශය විය. එහි පසු කාලීන ස්වරූපය කොත් කැරැල්ල නමින් දැක්වේ.
මේ තුළින් නවංග සත්ථු ශාසනය නිරූපණය වන බව සෙනරත් පරණවිතාන මහතා සඳහන් කරයි.

- **කොත**

කොත් කැරැල්ල මත පිහිටුවා ඇති කුඩා ස්තූපයක හෙවත් ධාතු කරඬුවක හැඩයෙන් යුත් නිර්මාණයයි. වර්තමානයේ තඹ පිත්තල ආදී ලෝහවලින් කොත නිමවා ඇත.
පරණවිතාන මහතාට අනුව කොතින් නිවන නිරූපණය කෙරේ.

- **චූඩා මාණික්‍යය**

කොත මුදුනෙහි පිහිටුවා ඇති මැණික්වලින් නිර්මාණය වූ සිළුවක් වැනි කොටසයි.

අංග දෙකක් නිවැරදිව නම් කිරීමට ලකුණු දෙකක් ද එක් අංගයක් කෙටියෙන් හැඳින්වීමට **එක් ලකුණක් ද** ප්‍රදානය කරන්න.

**(ලකුණු 03)**

| |
|---|
| **(iii) මහින්දාගමනයේ ප්‍රතිඵල ලෙස ශ්‍රී ලාංකිකයන්ට උරුම වූ දායාද පිළිබඳ ඇගයීමක් කරන්න.** |

- ශ්‍රේෂ්ඨ ආගමක් ලැබීම හා පැවති ඇදහිලි හා විශ්වාසයන්ට නව අර්ථකථන ලබා දීම.
- මහා විහාරය ඇතුළු වෙහෙර විහාර ඉදිවීම
- භික්ෂු-භික්ෂුණී සමාජය ඇතිවීම
- මහා විහාරය කේන්ද්‍ර කොට ගත් අධ්‍යාපන මධ්‍යස්ථාන හා අධ්‍යාපන ක්‍රියාවලියක් ආරම්භ වීම.
- ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව ලැබීම (දුමින්දාගමනය)
- ප්‍රතිමා කලාව හා වාස්තු විද්‍යාත්මක නිර්මාණ බිහිවීම
- චිත්‍ර, මූර්ති, කැටයම්, ගෘහ නිර්මාණ ආදී කලා අංග බිහිවීම
- අක්ෂර මාලාවක් ලැබීම හා සාක්ෂරතාව දියුණු වීම
- සිංහල හා පාලි ගද්‍ය-පද්‍ය සාහිත්‍යයක් බිහිවීම
- බෞද්ධ රාජ්‍ය පාලන මූලධර්ම පාදක කොටගත් රාජ්‍ය පාලන ප්‍රතිපත්තියක් සකස් වීම

ආදී අදාළ ඕනෑම කරුණු තුනක්වත් ඇතුළත් පිළිතුරකට සම්පූර්ණ ලකුණු ප්‍රදානය කරන්න.

පිළිතුර සමස්තයක් ලෙස සලකන්න.

**(ලකුණු 05)**

PAST PAPERS WIKI



CamScanner

**5. (i) පළමු ධර්ම සංගායනාව පැවැත්වීම සඳහා හේතු වූ කරුණු අතුරෙන් දෙකක් ලියන්න.**

- සුභද්‍ර භික්ෂුවගේ නො මනා ප්‍රකාශය
- දුර්මතධාරී භික්ෂූන්ගෙන් සසුන ආරක්ෂා කර ගැනීම
- අසංවිධානාත්මකව, විසිරී පැවති ධර්මය එකරාශි කිරීම

ආදී අදාළ කරුණු දෙකකට ලකුණු දෙක ප්‍රදානය කරන්න. (ලකුණු 02)

**(ii) එම සංගායනාව පැවැත් වූ ස්ථානය, සංගායනාව සඳහා ගත වූ කාලය සහ සහභාගි වූ රහතන් වහන්සේලා සංඛ්‍යාව සඳහන් කරන්න.**

- පළමු සංගායනාව පැවැත් වූ ස්ථානය : රජගහ නුවර වේභාර පර්වතය පාමුල සප්තපර්ණී ගුහාද්වාරය අභියස/ රජගහ නුවර වේභාර පර්වතය පාමුල/ රජගහ නුවර සප්තපර්ණී ගුහාද්වාරයේදී/ සප්තපර්ණී ගුහාද්වාරයේදී/ රජගහ නුවරදී
- ගත වූ කාලය : මාස හතයි/ මාස 7
- සහභාගී වූ රහතන් වහන්සේලා සංඛ්‍යාව : පන්සියයි/ 500

එක් කරුණකට එක ලකුණ බැගින් ලකුණු තුන ලබා දෙන්න. (ලකුණු 03)

**(iii) පළමු ධර්ම සංගායනාවේදී ගනු ලැබූ තීරණ සම්බුද්ධ සසුනේ චිර පැවැත්මට ඉවහල් වූ ආකාරය පැහැදිලි කරන්න.**

- පළමුවන ධර්ම සංගායනාවේදී ගනු ලැබූ තීරණ සම්බුද්ධ ශාසනයේ චිරස්ථායී බව පිණිස ඉවහල වූ බව.
- ධර්මයට හා විනයට පටහැනි සාවද්‍ය කරුණු, දුර්මත ආදිය බැහැර කිරීම.
- බුදුරජාණන් වහන්සේ අවුරුදු හතලිස් පහක් මුළුල්ලේ නොයෙක් ස්ථානයන්හි දී දේශනා කරන ලදුව, විසිරී පැවතුනු ධර්මය විධිමත් ලෙස සංග්‍රහ කිරීම.
- ඒ ඒ ධර්ම කොටස් එනම් ධර්ම විනය දෙක මුඛ පරම්පරාගතව රැකගෙන ඉදිරියට පවත්වාගෙන යාම සඳහා භාණක පරම්පරාවලට පැවරීම. සූත්‍ර පිටකය නිකාය පහකට ද විනය පිටකය කොටස් පහකට ද බෙදා මුඛ පරම්පරාගතව ගෙන යාම සඳහා ඒ ඒ මහරහතන් වහන්සේලාට හා ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරාවලට භාර කිරීම.
- සුභද්‍ර භික්ෂුව වැනි දුර්මතධාරී භික්ෂූන් නිහඬ කරවීම.
- කුඩා අනු කුඩා ශික්ෂාපද වෙනස් නොකොට බුදුන් (රජාණන්) වහන්සේ විසින් පනවන ලද සියලු ශික්ෂාපද ඒ ආකාරයෙන් ම පවත්වාගෙන යාමට තීරණය කිරීම.

පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න. (ලකුණු 05)

කරුණු 3ක් නම් නම් ල. 02. කරුණු 3ක් නම් නොමැති නම් ල. 03



CamScanner

**6. (i) "ජිගච්ඡා පරමා රෝගා" මෙහි අර්ථය පහදන්න.**

"කුසගින්න බලවත්ම රෝගය වේ."/ "සාගින්න ප්‍රබල රෝගය වේ"/ "බඩගින්න ලොකුම රෝගයයි."

මේ අදහස ඇතුළත් පිළිතුරකට ලකුණු දෙක ලබා දෙන්න. **(ලකුණු 02)**

**(ii) භද්දාලි සූත්‍රයේ දැක්වෙන පරිදි ආහාරයෙහි පමණ දැන අනුභව කිරීම නිසා ලැබෙන යහපත් ප්‍රතිඵල තුනක් ලියන්න.**

1. රෝගාබාධ අඩු බව
2. නිදුක් බව
3. සැහැල්ලු පැවැත්ම
4. කාය බලය
5. සුවපහසු පැවැත්ම

මින් කරුණු තුනක් නම් කර ඇත්නම් ලකුණු තුන ලබා දෙන්න. **(ලකුණු 03)**

**(iii) කායික හා මානසික නිරෝගිතාව රැකගැනීමේ වටිනාකම පිළිබඳ බුද්ධදහමේ දැක්වෙන කරුණු ඇගයීමට ලක් කරන්න.**

- කායික හා මානසික නිරෝගිතාව රැකගැනීමේ වටිනාකම බුදු දහම අවධාරණය කොට ඇත.
- කායික වශයෙන් මෙන්ම මානසික වශයෙන් ද දුක් පීඩා උපදවන රෝගාබාධවලින් වැළකී සිටීමේ වටිනාකම බුදු දහමේ පැහැදිලිව දැක්වේ.
- ශීල ශික්ෂණයෙන් යුක්තවීම කායික නිරෝගී බව ඇතිවීමට ඉවහල් වේ.
- පරිසරය පවිත්‍රව තබා ගැනීම කායික වශයෙන් නිරෝගී දිවිපෙවෙතක් ගත කිරීමට ඉවහල් වේ.
- "ආහාරෙ මත්තඤ්ඤුතාව" හෙවත් පමණ දැන ආහාර ගැනීමේ වටිනාකම කොසොල් රජතුමාට පහදා දී ඇත.
- ජීවක වෛද්‍යවරයාගේ ඉල්ලීම මත 'සක්මන් මළුව' අනුමත කිරීමෙන් කායික ව්‍යායාමය තුළින් කායික නිරෝගිතාව ඇති කර ගැනීමට අවකාශ දී තිබේ.
- මානසික රෝග පුද්ගල ජීවිතය බරපතල ලෙස පීඩාවට පත් කරයි. ඊට පිළියමක් ලෙස මනස සංවර කර ගැනීමට අදාළ කරුණු දේශනා කොට ඇත. භාවනාව මගින් සිත දියුණු කිරීමෙන් මානසික නිරෝගී බව ඇතිවේ.

මෙ ආදි අදාළ ඕනෑම කරුණු ඇතුළත් පිළිතුරකට සම්පූර්ණ ලකුණු ප්‍රදානය කරන්න.
පිළිතුර සමස්තයක් ලෙස සලකන්න. **(ලකුණු 05)**



CamScanner

Past Papers Wiki



7. පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකකට** කෙටි සටහන් ලියන්න.
   (i) ව්‍යාපාද නීවරණය
   (ii) ප්‍රතිමාඝර
   (iii) අලුවිහාර සංගායනාව
   (iv) මවුපිය දූදරු යුතුකම්

**(i) ව්‍යාපාද නීවරණය**

- පඤ්ච නීවරණ ධර්ම අතර දෙවැන්න යි. පුද්ගලයකු, වස්තුවක්, ක්‍රියාවක් ගැන අප්‍රිය ස්වභාවය, විරුද්ධ ස්වභාවය ව්‍යාපාදය යි. තරහව, කෝපය, වෛරය, ක්‍රෝධය, ද්වේශය යනුවෙන් හැඳින්වෙන්නේ ද මෙය යි. ව්‍යාපාදය හෙවත් තරහ උපන් සිතට හොඳ හෝ නරක කිසිවක් හඳුනා ගත නොහැකිය. මෛත්‍රී භාවනාවේ යෙදීමෙන්, කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කිරීමෙන් ව්‍යාපාදය ඇතිවීම දුරු කළ හැකි ය.

පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න. **(ලකුණු 05)**

**(ii) ප්‍රතිමාඝර**

- ප්‍රතිමා වන්දනය ප්‍රචලිත වීමත් සමග බුද්ධ ප්‍රතිමා සඳහා ඉදිකළ ගෘහය "ප්‍රතිමාඝර" නම් වේ.
- ප්‍රතිමාඝර ගන්ධ කුටි, පාසාද, ගෙඩිගේ ලෙස වර්ග කෙරිණි.
- ගන්ධ කුටි යනු බුදුන් වහන්සේ වැඩ විසූ කුටියයි. මුල්ම ප්‍රතිමාඝර සඳහා මේ නම භාවිත විය. කිරිබත් වෙහෙර, තොළුවිල, පන්කුළිය යන ස්ථානවල මෙබඳු ප්‍රතිමාඝර පැවති බව සැලකේ.
- පාසාද යනු මිගාර මාතු පාසාද සංකල්පය අනුව යමින් නිර්මාණය කළ විශාල මහල් සහිත ගොඩනැගිල්ලකි. රත්න ප්‍රාසාද ගොඩනැගිල්ල, බිසෝ මාලිගා ගොඩනැගිල්ල යන ස්ථානවලින් මීට අදාළ ආකෘති හමුවේ.
- ගෙඩිගේ යනු ප්‍රමාණයෙන් විශාල, වහලය පවා ගඩොලින් නිර්මාණය කළ පිළිම ගෙයකි.
- අනුරාධපුර යුගයේ අවසාන භාගයේ මෙම ආකෘතියේ ප්‍රතිමාඝර ඉදිවිය. ථූපාරාම පිළිමගෙය, තිවංක පිළිමගෙය, ලංකාතිලක පිළිමගෙය, නාලන්දා ගෙඩිගෙය මීට නිදසුන් වේ.
- මහනුවර යුගයේ ඉදිවුනු ටැම්පිට විහාර සම්ප්‍රදාය වෙනත්ම ආකාරයේ නූතන පිළිම ගෙයකි.

පිළිමගෙය පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් සඳහා ලකුණු ප්‍රදානය කරන්න.
පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න. **(ලකුණු 05)**



CamScanner

**(iii)** මාතලේ අලුවිහාර සංගායනාව

- මෙය පුස්තකාරූඪ සංගායනාව ලෙස ද හැඳින්වේ. මෙම ධර්ම සංගායනාවේ ප්‍රධාන අරමුණ වූයේ ධර්මයේ අනාගත සුරක්ෂිතතාව තහවුරු කරලීමයි. සියවස් පහකට අධික කාලයක් මුඛ පරම්පරාගතව පවත්වාගෙන එනු ලැබූ ථේරවාදී ත්‍රිපිටක ධර්මය පළමුවරට පුස්කොල පොත්වල ලියැවුනේ මෙම සංගායනාවේදී ය.
- මහාවිහාර හා අභයගිරි භික්ෂූන් වහන්සේලා අතර ඇති වූ ශාසනික අර්බුද, වලගම්බා රාජ්‍ය සමයේ ඇති වූ බැමිණිතියා නම් සාගතය නිසා භික්ෂූන් වහන්සේලාගේ ජීවිතවලට ඇති වූ බලපෑම, සාගතය නිසා ප්‍රත්‍ය පහසුකම් නොමැතිවීම නිසා භික්ෂූන් වහන්සේලා වෙනත් රටවල් කරා යාම, වලගම්බා රාජ්‍ය සමයේ ඇති වූ යුද ගැටුම්, ලාංකේය භික්ෂූන්ගේ ශාසනික පිළිවෙත් පිරිහී යාම, භික්ෂූන් වහන්සේලා අතර ග්‍රන්ථ ධුරය හා විදර්ශනා ධුරය පිළිබඳ ඇති වූ තරඟකාරීත්වය ආදී කරුණු මෙම සංගායනාව පැවැත්වීමට තුඩු දුන් හේතු විය.
- ථේරවාද බුදු දහමේ චිර පැවැත්මට අලුවිහාර සංගායනාව ඉවහල් විය.

පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න. **(ලකුණු 05)**

**(iv)** මව්පිය-දූදරු යුතුකම්

- දෙමාපියන් විසින් දූ දරුවන්ට ඉටුකළ යුතු යුතුකම්
  1. දරුවන් වරදින් මුදවා ගැනීම
  2. යහපත් කටයුතුවල යෙදවීම
  3. ඉගෙනීමේ කටයුතුවල යෙදවීම/ මැනවින් ඉගැන්වීම
  4. ගැලපෙන ආවාහ විවාහ කරදීම
  5. සුදුසු කල්හි සම්පත් පවරාදීම
- දූ දරුවන් විසින් දෙමාපියන්ට ඉටුකළ යුතු යුතුකම්
  1. මව්පියන් පෝෂණය කිරීම
  2. ඔවුන්ගේ කටයුතු සොයා බලා ඉටු කර දීම
  3. දෙමාපියන් රැකගෙන ආ කුල පරපුර හා ඊට සම්බන්ධ සිරිත් විරිත් ආරක්ෂා කිරීම
  4. දෙමාපියන්ගෙන් හිමි වූ දේ රැක ගැනීම
  5. මව්පියන් පරලොව ගිය පසු පින් අනුමෝදන් කරවීම

ඉහත කරුණු අතුරින් කිහිපයක් ඇතුළත්ව හෝ පොදුවේ කළ පැහැදිලි කිරීමකට සම්පූර්ණ ලකුණු දෙන්න.

පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න. **(ලකුණු 05)**

***



PAST PAPERS WIKI
www.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library
CamScanner